# වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂයේ /53 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව

### 2022-07-14

**පැමිණීම**

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
8. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
9. ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
10. ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
11. ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
12. ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය
13. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා
14. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
15. ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
16. ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා
17. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
18. ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
19. ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
20. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා
21. ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
22. ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය
23. ගරු මන්ත්‍රිනී එම්.එම්.මේරි.වාලට් කුරේ මහත්මිය
24. ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි චමෝදරී ප්‍රනාන්දු මහත්මිය
25. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා
26. ගරු මන්ත්‍රිනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
27. ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
28. ගරු මන්ත්‍රී අයි.බී.සැම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
29. ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුභසිංහ මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01. 2022-06-09 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

- ❖ ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව 20 වන පිටුවේ තම නම " ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමසිංහ මහතා" යනුවෙන් සඳහන් වී ඇති බවත් එය සංශෝධනය කරන ලෙසට ප්‍රකාශ කරන ලදී.

සංශෝධනය- "මෙහිදී අදහස් ගණනාවක් ඉදිරිපත් වූ බවත්,පරිපාලනය පසෙන් බලන විට විශාල අභියෝගයක් තිබෙන බවත්,අප සිතාගෙන සිටින දෑ සභාව තුළ කිරීමට හැකිවේදැයි කිසිවෙකු නොදන්නා බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී." ලෙසද,

"පරිපාලනයේ දුර්වලතා රැසක් තිබෙන බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී." ලෙසද,

"රජයේ මුදල් ඉක්මනින් නොලැබෙන බවත්, මෙහිදී යකඩ වැස්සට තෙමෙනවාද යන්න සභාව විසින් තීරණය කල යුතු බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී." ලෙසද,

"දිරන යකඩ සභාවට අයත් නොවන බවත්, ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ජ්‍යෙෂ්ඨතම මන්ත්‍රීතුමෙකු වී ලොකුම වරද නිවැරදි කරන බවත් මෙය සිදු කල යුතු වැඩ කටයුත්තක් බවත් නමුත් අවශ්‍ය මුදල් නොලැබී ඇති බැවින් මේ පිළිබඳව තමන් කතා කල බවත් ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ප්‍රකාශ කරන ලදී.රටේ අතිගරු ජනාධිපතිතුමාද,ගරු අගමැතිතුමාද,ගරු මුදල් ඇමතිතුමාද හෙට දින සිට දෙවේලක් පමණක් ආහාර ගැනීමට සිදු වන බව පවසන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී." ලෙසද, සංශෝධනය කරන ලදී.

- ❖ ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය මහා සභාවේදී සංශෝධනයක් ඉදිරිපත් කල බවත්, එය වාර්තාවේ නිවැරදිව සඳහන් වී නොමැති බවත්, එවැනි ප්‍රකාශයක් හඬ පටයේ තිබේද යන්නත් ගැටළුවක් තිබෙන බවත්, හඬ පටයේ තිබෙන කොටස එලෙසම සඳහන් කරන ලෙසත්, එම කොටසේ රෙකෝඩින් එක තමන් සතුව තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. එය වීඩියෝ කර ගැනීමට එදින ඉඩ ලබා නොදුන් බවත් මහා සභාව වීඩියෝ කර ගැනීමට අවස්ථාව ලබාදෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.සභාවේ පැවසූ දෙය ඇතුළත් කරන ලෙසත් නොපැවසූ දේ වාර්තාවට ඉදිරිපත් නොකරන ලෙසත් ඉල්ලා සිටින ලදී.වාර්තාව ලේකම්මහතාගේ වගකීම බවත් එය තවමත් ලබානොදුන් බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම සංශෝධනයට අදාල කොටස නැවත පටිගත කිරීම් සම්බන්ධව පරීක්ෂා කර බැලූ අතර එය වාර්තාවේ සඳහන් ආකාරයෙන් පටිගත වී ඇති බැවින් සංශෝධනය කිරීමට යමක් නොමැති බව සඳහන් කරමි.

- ❖ එමෙන්ම 10 වන පිටුවේද තම ප්‍රකාශයක් සම්බන්ධයෙන් සංශෝදනයක් තිබෙන බවත්, අවසන් ඡේදයට ඉහළින් තිබෙන ඡේදයේ ප්‍රධාන රජයක් තිබීමේදී ලෙස සඳහන් වන බවත්, සැමදාම ප්‍රධාන රජයක් තිබෙන බවත් එහිදී තමන් පැවසූයේ ගරු සභාපතිතුමන්ලාගේ පොදු ජන පෙරමුණේ රජයක් තිබීමේදී සහ සභාවත් පොදු ජන පෙරමුණ යටතේ තිබියදී පහසුවෙන්ම මෙම කාර්යය සම්බන්ධීකරණය කරගෙන කරන ලෙසට කාරණාව මතු කර පෙන් වූ බවත් එය හඬ පටයෙන් බලන ලෙසත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.කුඩා වචනයකින් සියල්ල විකෘති වන බවත්, අවශ්‍ය කොටස නොමැතිව බවත් බොහෝ විට යම් දෑ ලිඛිත භාෂාවෙන් ලස්සනට සඳහන් වූවද තම ප්‍රකාශ බැලීමේදී මුල සිටම තමන් පැවසූ බොහෝ දෑ වල විකෘතියක් තිබෙන බවත්, සිංහල වාක්‍ය ගලපා නොමැති බවත් නමුත් අනෙක් සියල්ල හොඳින් ගලපා ඇති බවත් දිගින් දිගටම මෙලෙස කටයුතු වේ නම් සමාජගත කිරීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.මහා සභා වාර්තාව වගකීමෙන් ඉදිරිපත් කරන ලෙසත් ලේකම්මහතා වාර්තාව සම්බන්ධයෙන් බැඳී සිටින බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

සංශෝධනය-හඬ පටියේ සඳහන් ආකාරය අනුව පහත සඳහන් පරිදි සංශෝධනය සිදු කර ඇත.

" ගරු මන්ත්‍රීවරුන්ගේ යෝජනා හොඳ බවත්, ගරු සභාපතිතුමන්ලාගේ ප්‍රධාන රජයක් තිබීමේදී මෙම කටයුතු සිදු කිරීමට පහසු බවත්,රාජ්‍ය ආයතන,ටෙලිකොම් ආයතනය ජල සම්පාදන මණ්ඩලය වැනි ආයතන ඒකාබද්ධව නොමැති බවත් මේවා එකතු කරගෙන ඉදිරියට තිබෙන ව්‍යාපෘති පිළිබඳව සාකච්ඡා කර සභාව දැනුවත් කරන ලෙසටද ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී."

- ❖ මහා සභා වාර්තාව ලේකම්මහතාගේ වගකීමක් බවත්, මහා සභා වාර්තාව සකස් කිරීමේදී ඒ පිළිබඳ දැනුමක් තිබෙන අයෙකුට එය භාරදෙන ලෙසත්, යම් දේවල් කියවාගෙන යාමේදී තම ප්‍රකාශ වලද අර්ථය විකෘති වී යම් දේවල් පෙනෙන බවත් එබැවින් දැනුමක් තිබෙන අයෙකුට භාරදුන්නේ නම් හොඳ බව තමන් යෝජනා කරන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

- ❖ 24 වන පිටුවේ තිබෙන ලේකම්මහතාගේ කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීම පිළිබඳව වූ කතාවේදී "ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව පළමුවෙන්ම ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මියට පිළිතුරු ලබාදෙන බවත්,අප්‍රියෙල් මස මන්ත්‍රීතුමියට චෙක්පත රැගෙන යන ලෙසට දැනුම් දී ඇති බවත්, තවමත් චෙක්පත මුදල් අයකැමි ළඟ තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී." ලෙස සඳහන් වන බවත් එය එසේ කිරීමට නොහැකි බවත් එය සංශෝධනය කරන ලෙසටත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

  ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාද ඒ පිළිබඳව තමන්ට පැවසූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

  එහිදි චෙක්පත රැගෙන යන ලෙසට මන්ත්‍රීතුමියට නොව අදාල කොන්ත්‍රාත්කරුට දැනුම්දෙන ලෙසට මන්ත්‍රීතුමියට පැවසූ බව එහිදී සඳහන් කල බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

සංශෝධනය- හඬ පටියේ සඳහන් ආකාරය අනුව පහත සඳහන් පරිදි සංශෝධනය සිදු කර ඇත.

"ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව පළමුවෙන්ම ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මියට පිළිතුරු ලබාදෙන බවත්,අප්‍රියෙල් මස චෙක්පත රැගෙන යන ලෙසට පැමිණෙන ලෙසට අදාල කොන්ත්‍රාත්කරුට දන්වන ලෙස ගරු මන්ත්‍රීතුමියට පණිවිඩය ලබා දී ඇති බවත්, තවමත් චෙක්පත මුදල් අයකැමි ළඟ තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී."

- ❖ 14 වන පිටුවේ කම්මල ඉඩමක් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා අදහස් ඉදිරිපත් කර ඇති බවත්, ඒ සම්බන්ධව ගත් ක්‍රියා මාර්ගය පිළිබඳව විමසා සිටින ලදී.

මායිම් කම්බි ගසන ලෙසට පැවසූ බැවින් එය ඇස්තමේන්තුගත කර කර්මාන්ත කමිටුවට යොමු කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එහිදී මනින ලෙසටද පැවසූ බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

රජයේ මිනින්දෝරුමහතා යොමු කර මැනුම් කටයුතු සිදු කර වසර කීයකට බදු දෙන්නේද යන්න තීරණය කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ බදු ලබාදෙන්නේ නම් වසරකට පමණක් ලබා දෙන ලෙසට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

හිටපු ගරු සභාපති ට්‍රෙවින් ප්‍රනාන්දු මහතාගේ කාලයේදී සිටම මෙම ඉඩම් කොටස තිබූ බවත් එකලද තමන් සභාවේ සිටි බවත් එතැන පර්චස් 90ක් පමණ තිබූ බවත් එය මේ වන විට පර්චස් 80 දක්වා අඩු වී ඇති බවත් පර්චස්.10කට කුමක් සිදු වූයේදැයිද යන්නද ගැටළුවක් වී තිබෙන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. එබැවින් කැබලි කල ඉඩමේ වෙන්කර තිබෙන කොටස කොපමණද යන්න පැහැදිලි කරගෙන කටයුතු කරමුයැයි ද ප්‍රකාශ කරන ලදී.

එහි තිබෙන ඉඩමේ ප්‍රමාණය පළමුව බලන ලෙසට ගරු සභාපතිතුමා ලේකම්මහතාට දැනුම් දෙන ලදී.

තීරණ අංක 08 යටතේ බදු ලබානොදිය යුතු බවට සඳහන් වන බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් මනින ලෙසට එහිදී සඳහන් කල බවත්, පළමුව ඉඩමේ අයිතිය කොපමණ ප්‍රමාණයක්ද තිබේද යන්න තහවුරු කරගන්නා ලෙසට පැවසූ බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය බදු ලබා දීමට මේ මොහොතේ කලබල නොවන ලෙසත්, නමුත් තීරණය සංශෝධනය කල යුතු බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

සභාවට යම්කිසි මුදලක් ලැබෙන්නේ නම් එය බදු දීමේ වරදක් නොමැති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඉඩමක් නිකම් තිබෙනවාට වඩා එය බදු දී හෝ ආදායමක් උත්පාදනය කරන්නේ නම් වරදක් නොවන බවත් නමුත් සභාවට අයත් භූමි ප්‍රමාණය අඩු කරගෙන බදු දී ඵලක් නොමැති බවත් ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙසටද එය සිදු කල පසුව සභාවට ආදායමක් ලැබෙන මාර්ගයකට යොමු කරන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් මේ සම්බන්ධයෙන් ලේකම්වරයා හරහා මහා සභාවට ආදායම් පරීක්ෂක වාර්තාවක් ඉල්ලූ බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

එය සභාවට ඉදිරිපත් නොකලේ ඉදිරි වැඩ කටයුතු ද කිරීමට තිබෙන නිසා බැවින්යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

බදු දීම ඉදිරියට යාමට පෙර මෙම කාරණය සම්පූර්ණ කරගන්නා ලෙසටත්, තම ප්‍රකාශය පසුගිය මහා සභා වාර්තාවේද තිබෙන බවත්, එහි භූමි ප්‍රමාණය කොපමණද? , ගොඩනැගිල්ල තිබේද, ගස් ප්‍රමාණය, වටිනාකම කුමක්ද, කාට මෙමඟින් කරදරයක් සිදු වී තිබේද යන්න සියළු දේ ඇතුළත් වාර්තාවක් සභාගත කරන ලෙසටද තවදුරටත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ඉල්ලා සිටින ලදී.මේ සඳහා කොමසාරිස් අනුමැතියක් ගැනීමට සිදු වන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙම තීරණය සංශෝධනය කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

බදු ලබා දීමට පෙර යන්න ඉදිරියට ගෙන තීරණය සංශෝධනය කරමුයැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

ආදායම් පරීක්ෂක වාර්තාවක් සියළුම තොරතුරු සමඟ ඊළඟ මහා සභාවට ඉදිරිපත් කරන ලෙසට ලේකම්මහතාට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

බදු ලබා දෙනුයේ කෙසේද යන්න ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා විමසා සිටින ලදී.සාමාන්‍යයෙන් බදු දීමේදී යම්කිසි මුදල් ප්‍රමාණයක් තිබේද යන්නත් විමසා සිටින ලදී.

එක් එක් ප්‍රදේශ වල තිබෙන වටිනාකම අනුව එය තීරණය වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය සභාවේ සිටින ආදායම් පරීක්ෂකමහතා ගොස් එහි වටිනාකම ලබා ගන්නා බවත්, වෙලඳ වටිනාකම කෙසේද? ව්‍යාපාරයක් සිදු කරන්නේ නම් එමඟින් ලැබිය හැකි ආදායම් තත්ත්වය කෙසේද? යන්න සොයා බලන බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් විමසනුයේ මිල තක්සේරු කරන ක්‍රමවේදය බව ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

ආදායම් පරීක්ෂක විසින් ලබා දෙන තක්සේරුව මඟින් එය සිදු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සංශෝධනය-

"තීරණ අංක 08

මෙම ඉඩම සංචාරක හෝටල් ආසන්න ප්‍රදේශයේ පිහිටා ඇති වටිනා ඉඩමක් බැවින් එම ඉඩම මිනුම් කර කම්බි ගසා නිවැරදි තක්සේරුවක් ලබා ගන්නා තෙක් එය බදු ලබා නොදිය යුතු බවත්,එය

ආරක්ෂා කල යුතු බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී"

| |
|---|
| තීරණ අංක 01<br><br>**2022-06-09 වන දින පැවති මහා සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.** |

## <u>02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන</u>

01. නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 02

මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- **ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය**
- **ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා**
- **ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා**
- **ගරු මන්ත්‍රීනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය**
- **ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා**
- **ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා**
- **ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා**
- **ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා**
- **ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා**
- **ගරු මන්ත්‍රීනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය**
- **ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා**
- **ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා**
  **ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුහසිංහ මහතා**

b) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 03

2022 මැයි මස, ජුනි මස සහ ජූලි මස පැවති පහත සඳහන් කාරක සභා සඳහා **සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

| **2022 ජුනි මස 13** වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව | |
|---|---|
| අ/අ | නම |

| | |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා |
| **2.** | ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| **3.** | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| **4.** | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **5.** | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |

**2022 ජුලි මස 05 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා |
| **2.** | ගරු මන්ත්‍රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා |
| **3.** | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| **4.** | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **5.** | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා |
| **6.** | ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා |
| **7.** | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා |

**2022 මැයි මස මස 27 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **2.** | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| **3.** | ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| **4.** | ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා |
| **5.** | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| **6.** | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| **7.** | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා |
| **8.** | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |

**2022 ජුනි මස 17 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| **3.** | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |
| **4.** | ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා |
| **5.** | ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා |

**2022 ජුනි මස 30 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රිනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| **2.** | ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා |
| **3.** | ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා |
| **4.** | ගරු මන්ත්‍රී කේ.එන්.සුදත් ජානක පෙරේරා මහතා |
| **5.** | ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා |
| **6.** | ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය |
| **7.** | ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා |

02. රජයේ මූල්‍ය නොවන වත්කම් කලමනාකරණය, පොදු දේපල විනාශ වීම සහ රජයට ලැබෙන ආදායම අහිමි වීම වැළැක්වීම සඳහා රජය සතු වාහන නිසි ලෙස භාවිතා කිරීම,නඩත්තු කිරීම සහ

බැහැර කිරීම පිළිබඳව අප සභාව මඟින් දැක්වූ සහයෝගයට ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මඟින් එවා ඇති ඇගයීම් ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.
එහි පිටපතක් ලබාදෙන ලෙසට ගරු මන්ත්‍රීවරුන් විසින් ඉල්ලා සිටින ලදී.
සභාවේ සිටින ගරු මන්ත්‍රීවරුන්ට පිටපතක් ලබාදෙන ලෙසට ලේකම්මහතාට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

03. වෙන්නප්පුව බල ප්‍රදේශයට අයත් හඳුනාගත් මාර්ග 4013ක් GIS තාක්ෂණය මඟින් සිතියම් ගත කර, සකසන ලද මාර්ග නාමාවලිය මා විසින් පළාත් පාලන කොමසාරිස්තුමා වෙත පසුගිය දින භාරදීමට කටයුතු කල බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් ලේකම්මහතා , සිතියම්ගත කිරීම සඳහා GIS තාක්ෂණය භාවිතයෙන් මිනුම් ගැනීමට කටයුතු කල කණ්ඩායම ඇතුළු සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

04. පසුගිය ජූනි මස නව කොම්පෝස්ට් අංගණය ඉදි කරනු ලබන සෙන්දිරියාමුල්ල ඉඩමේ වගා සංග්‍රාමය ආරම්භ කිරීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ඇතුළු සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

05. වාර්ශික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම යටතේ 2022-07-11 වන දින වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවෙන් සමුගත් සියලුම සංවර්ධන නිලධාරීන්, කලමනාකරණ සේවා නිලධාරීන්, ආදායම් පරීක්ෂක නිලධාරීන් සියළුම දෙනාට හෘදයාංගම සුභ පැතුම් මේ මොහොතේදී එක් කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.මෙලෙස වසර ගණනාවකට පසුව නිලධාරීන් රැසක් එකවර ස්ථාන මාරු ලබා ගිය බවත් වයඹ අභිමානය පුත්තලම් දිස්ත්‍රික්කයේ හදවත යන විරුද්ධාවලියන් ලබා ගැනීමට මේ සියළුම දෙනාද කැපවීම් කල බවත් එබැවින් වෙන්නප්පුව බල ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශංසාව ද මේමොහොතේද එක කරන බවත් එමෙන්ම එදින එම සමුදීමේ උත්සවය සූදානම් කිරීමට කටයුතු කල ලේකම්මහතා ඇතුළු සියළුම දෙනාටත් ස්තූතිය පුද කරන ලදී.

06. 2022 ජූනි මස සහ මැයි මස පහත සඳහන් මාර්ග වල වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

- කටුකෙන්ද දොන් බොස්කෝ අසල පාර ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම
- හාල්දඹුවන මල් ෆාම් අසල පාර වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම
- කම්මල ශා.ඕදිලියා මාවත හා බෙනිල් මාවතේ වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීම

07. සෙන්දිරියාමුල්ල කොම්පෝස්ට් අංගණයේ ප්‍රගතිය ඡායාරූප සමඟ ගරු මන්ත්‍රීවරුන්ට ඩිජිටල් තිරය ඔස්සේ ඉදිරිපත් කරන ලදී. මුදල් කමිටුවේ සහ කර්මාන්ත කමිටුවේ අනුමැතිය සූර්ය බල ශක්ති පද්ධතිය සඳහා ලබා ගත් බවත් අද දින ගරු මහා සභාව දැනුවත් කිරීමට ව්‍යාපෘතියේ උපදේශක මහතා වන සූනිත්‍ය බල ශක්ති අධිකාරියේ ඉංජිනේරු සනත් කිත්සිරි මහතා පැමිණෙන බවත් ප්‍රකාශ කරන ලදී.

08. සභාවේ වර්තමාන තත්ත්වය පිළිබඳව ඉදිරිපත් කිරීමට තමන් සූදානම් වී සිටින බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබා ගත් ණය වෙනුවෙන් තවදුරටත් රු.1,555,586ක මුදලක් පමණක් ගෙවීමට ඉතිරිව ඇති බවත්,සෙන්දිරියාමුල්ල නව කොම්පෝස්ට් අංගණයේ මෙතෙක් ඉදි කර ඇති කොටස් සඳහා සභා අරමුදලින් ගෙවීම් සිදු කර ඇති බවත්, මේ සඳහා රජයෙන් අප සභාවට මුදල් ලැබීමට තිබෙන බවත්,අදාල කොන්ත්‍රාත්කරුවන් විසින් සපයා ඇති යකඩ පර්ලින් සඳහා තවදුරටත් ලක්ෂ 13 ක් පමණ ගෙවීමට ඇති බවත්, එම මුදල ගෙවූ පසු මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 10කට ආසන්න මුදලක් සභා අරමුදලින් ගෙවා ඇති අතර එම මුදල් ඉදිරියේදී ලැබීමට තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

දැනට ගෙවීමට ඉතිරිව ඇති රු.513,000.00ක බිල්පත් පමණක් ඉතිරිව ඇති බවත්, කොන්ත්‍රාත් කටයුතු නිම කර රිටෙන්ෂන් සමඟ තිස්ලක්ෂයක් පමණ ගෙවීමට තිබෙන බවත්,එමෙන්ම මේ වන

විට සභාවට අවශ්‍ය ඉන්ධන මුදල් ගෙවා ලබා ගන්නා බවත් ලක්ෂ 04ක මුදලක් සමුපාකාරයේ තැන්පත් කර තිබෙන බවත්, වාහන අළුත්වැඩියා කල බිල්ද එදිනෙදා ගෙවාගෙන යන බවත් මේ වන විට ණය නොමැති සභාවක් බවට අප සභාව පත් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

මුද්දර ගාස්තු 2022 වර්ෂයට ලැබී නොමැති බවත්, 2021 පළමු කාර්තුව පමණක් ලබාගෙන ඇති බවත් කෝටි 10ක් පමණ ලැබීමට තිබෙන බවත් එමෙන්ම උසාවි දඩද මාස ගණනක් ලැබීමට තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

තමන් සභාවේ වර්තමානය තත්ත්වය පිළිබඳව දළ වශයෙන් පැහැදිලි කිරීමක් සිදු කල බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

දේශීය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබා ගත් මුදල කොපමණදැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

රු.21,036,214.62ක මුදලක් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන ඇති බවත්, ඒවා දංකොටුව සීජේ මාවත හා මිරිස්සන්කොටුව පාර වැඩි දියුණු කිරීම හා මෝටර් ග්‍රේඩරයක් මිලදී ගැනීම සඳහා ලබාගෙන ඇති බවත් පැහැදිලි කරන ලදී.

## 03.යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

i. කම්මල, වයික්කාල "ඩොල්ෆින් ක්ලබ් හොටෙල්" ආයතනය විසින් සභාවට එරෙහිව කොළඹ අභියාචනාධිකරණයේ පවරා ඇති CA PHC 202/2019 දරණ නඩුව සඳහා ජනාධිපති නීතිඥ කලිංග ඉන්ද්‍රතිස්ස මහතා පත් කිරීමටත්, එම මහතා විසින් ඉදිරිපත් කර ඇති නීතිඥ ගාස්තු සම්බන්ධවද ගරු මහා සභා අනුමැතියක් ලබා ගැනීමටත් අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

හලාවත මහාධිකරණයේ ඩොල්ෆින් හෝටලයෙන් සභාවට අයවීමට තිබූ නඩුව සභාව මඟින් දිනා ඇති බවත්, ඉන්පසුව එම ආයතනය එම නඩුව කොළඹට ගෙන ගිය බවත්, මෙම මස 20 වන දින නඩුවට පෙනී සිටිය යුතු බවත් එහිදී නඩු ගාස්තුද අයකර ගැනිමට යටත්ව මෙම නඩුව භාරදෙන බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙහිදී සාකච්ඡා කොට නඩු ගාස්තුව අඩු කරගැනීමට පියවර ගන්නා බවත්, පලාත් පාලන විෂය හොඳින් දන්නා නීතිඥවරයෙකු තෝරාගෙන තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ද නීතිපති දෙපාර්තමේන්තුවෙන් නීතිඥවරයෙකු සම්බන්ධ කර ගැනීමට හැකි නම් කතා කරන ලෙසටද තමන් සමඟ සාකච්ඡා කල බවත්, ඒ සම්බන්ධව ද තමන් කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදී.

හලාවත තීන්දුව ඇපිල් (අභියාචනාවක්) කර තිබේදැයි ද ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

හලාවත අප දිනූ නඩුව ඇපිල් කර ඇති බවත්, කෝටි ගණනක මුදලක් ලැබීමටද තිබෙන බවත්, මෙම නීතිඥ ගාස්තුවද නඩුව දිනූ පසුව ලබා ගත හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙම ගෙවන නඩු ගාස්තුවද ඉතිරි කර ගැනීමට හැකි බැවින් නීතිපති දෙපාර්තමේන්තුවට කතා කර නීතිඥවරයෙකු පත් කරගන්නා ලෙසට ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා පැවසූ බව ප්‍රකාශ කරන ලදී.

සාමාන්‍යයෙන් නීතිඥවරුන් මෙවැනි ගාස්තුවක් අය කරනා බවත්, නීතිපති දෙපාර්තමේන්තුවේද නීතිඥවරුන් සිටින බවත්, නීතිය පවතිනුයේ තර්කය මත බවත් එය කුමන පසට පෙරළේදැයි

නොදන්නා බැවින්ද මෙම මුදලට වගකීමට සභාවට සිදු වන බවත් ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.
තමන්ද ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාගේ අදහසට එකඟ බවත්, මෙය පුද්ගලික නඩුවක් නොවන බැවින් අනිවාර්යයෙන්ම රජයේ නිතිඥවරයෙකුගේ සහය ගැනීමට අපට අයිතියක් තිබෙන බවත්, එබැවින් නීතිපති දෙපාර්තමේන්තුවට දැනුම්දීමක් කර රජයේ නීතිඥමහතෙකු පත් කර ගත හැකි බවත් ගරු මන්ත්‍රීනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය ප්‍රකාශ කරන ලදී.
සභාවේ ජේෂ්ඨ නීතිඥ ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රමුඛ නීතිඥවරුන් පස් දෙනෙකු සිටින බවත්, ගරු සභාපතිතුමා එම නීතිඥවරුන් සමඟ සාකච්ඡා කොට තීන්දුවක් ගෙන මෙම කාරණය සභාගත කලේ නම් මීට වඩා යහපත්යැයි තමන් සිතනා බවත්, නීතිපති දෙපාර්තමේන්තුවේද සභාවට කැමැත්තෙන් සහය වන නීතිඥවරුන්ද සිටිය හැකි බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. මෙම විෂය හා විෂය පථය පිළිබඳව බැලීමේදී ගාස්තුව නිර්ණය කල නොහැකි බවත්, නීතිඥවරුන් සමඟ සාකච්ඡා කොට මෙය මුදල් කමිටුවට යොමු කලේ නම් හොඳයැයිද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.
පෙරේදා දින තමන්ට මෙය ලැබුණ බවත්, 20 වන දින මෙම නඩුව විභාග වන බවත්, මෙම ගාස්තු ගෙවන්නේද යන්න මෙහිදී තීරණය කල යුතු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.
හලාවත දී නඩුවට පෙනී සිටියේ මෙම නීතිඥමහතාමදැයි ද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.
සුරංගා රණ්දෙණිය නීතිඥමහත්මිය පෙනී සිටිය බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.
මෙය ජයග්‍රහණය කල යුතු බවත්, ජයග්‍රහණය කරන ස්ථාවරයකට පැමිණ මේ සඳහා තීන්දු තීරණ ගතයුතු බවත් ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය අභියාචනාධිකරණයට ගිය පසුව ලංකාවටම බලපාන තීන්දුවක් වන බවත්, මෙහි කුමක් හෝ සිදු වී වෙනසක් සිදු වූවහොත් එය ලංකාවේම හෝටල් වලට වාසියක් වන බවත් හෝටල් සංගමයද මෙම නඩුව අත නොහැර සටන් කරන බවත්, ඔවුන් අළුත් මතයක් ගතහැකි බවත් ප්‍රකාශ කරන ලදී. නීතිඥ මහතාගේ ගෙවීම් සම්බන්ධ ලිපිය අනුව ගෙවීම් කරන්නේ නම් **එකවිට ගෙවන (Block fee) ක්‍රමය හොඳ බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. එහිදී ලිඛිත දේශන ගොණු කිරීමට අමතරව යනුවෙන් සඳහන් වන බවත්, තවත් මුදලක් ඒ සඳහා වියදම් වන බැවින් එතැනදී සාකච්ඡා කොට එකවිට ගෙවන (Block fee) එක සමඟම එය ගෙවීමට තීරණයක් ගතහොත් හොඳයැයිද ප්‍රකාශ කරන ලදී.**
සමස්ථ හෝටල් පද්ධතියම මෙහිදී සිටින බවත්, නඩුව පැරදීමට නොයා යුතු බවත් ගරු මන්ත්‍රී සී.පී. සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.
මෙය මෙතැනින් නොනැවතී ශ්‍රේෂ්ඨාධිකරණයට යන බවත්, අවසන් තීන්දුව ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දෙන බවත් **ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.**
මෙම නඩුවට 20 වන දින පෙනී සිටීමට සිදු වන බවත්, යම් මුදලක් අඩු කර ගැනීමට හැකි නම් සාකච්ඡා කොට අඩු කර ගැනීමට කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ලිඛිත දේශණයත් ඇතුළත්ව **Block fee ක්‍රමය යටතේ සාකච්ඡා කොට ගාස්තුව ගෙවන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.**

මෙහිදී කේවල් කිරීම සුදුසු නොවන බව ගරු මන්ත්‍රීවරුන් විසින් සාකච්ඡා කරන ලදී.

මුදල සලකා බැලිය හැකි බව නීතිඥවරයාගේ ලිපියේ සඳහන් කර තිබෙන බව **ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.**

මෙම නීතිඥමහතාට මෙම නඩුව පිළිබඳව පුළුල් අවබෝධයක් ලබා දී තිබේදැයිද ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදි.

පලාත් පාලන විෂය පිළිබඳ අවබෝධයක් තිබෙන නිතීඥමහතෙකු තෝරාගෙන සිටින බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නඩු ගාස්තු ගෙවා පමණක් ප්‍රමණවත් නොවන බවත්, නඩුව කැඳවීමට පෙර සභාවේ තත්ත්වය නීතිඥමහතාට පැහැදිලි කර දෙන ලෙසත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදි.ලිඛිත දේශන සඳහා කොපමණ මුදලක් අය කරන්නේද යන්නත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

ලිඛිත දේශන සඳහා රු.315,000.00ක මුදලක් සඳහන් කර තිබෙන බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

රාජ්‍ය ආයතනයක් ලෙස නීතිපති දෙපාර්තමේන්තුව ද තිබියදී මෙලෙස නඩු ගාස්තුවක් ගෙවාගෙන නඩුවක් ගෙනයාමට හැකිදැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.අප රාජ්‍ය ආයතනයක් බවත් රාජ්‍ය ආයතනයක් ලෙස පළමුව නීතිපති දෙපාර්තමේන්තුව දැනුවත් කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී. මෙය පෞද්ගලික ගැටළුවක් නොවන බවත්,රජයට ලැබෙන ආදායම් වැළැක්වීමක් සම්බන්ධ නඩුවක් බවත් එහිදී රාජ්‍ය ආයතනයක ගැටළුවක් වූ පසුව එහි සිටින නීතිඥවරුන් නීතිපති දෙපාර්තමේන්තුවට එය භාරදෙන බවත්, එවිට නීතිපති දෙපාර්තමේන්තුව මඟින් අවශ්‍ය තොරතුරු ගෙන්වාගෙන අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

පණතත් සමඟ මේ සම්බන්ධව සොයා බලන ලෙසට ලේකම්මහතාට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

මහාධිකරණයේ මෙම නඩුව සම්බන්ධව කතා කර තිබෙනුයේ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් පෙනී සිටින නීතිඥ මහත්මියම බවත්, තමන් දන්නා පරිදි එහිදී නීතිඥතුමියට ලිඛිත ගාස්තුව නිතිඥගාස්තු ලෙස අයවැයෙන් වෙන්කල මුදලක් ගෙවීමට තිබෙන බවත් ගරු මන්ත්‍රීනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය ප්‍රකාශ කරන ලදී. නමුත් මෙහිදී ඉන් පරිබාහිරව වෙනත් අයෙකුගේ සේවය ලබා ගැනීමට යන බවත්, මෙහිදී මන්ත්‍රීතුමා නීතිපති දෙපාර්තමේන්තුවෙන් සහය ගනිමුයැයි යෝජනා කල බවත්, රජයේ ආයතනයක් ලෙස එය සිදු විය යුතු බවත්, නඩුව සම්බන්ධයෙන් රජයේ ආයතනයක් ලෙස අනිවාර්යයෙන්ම නිතිපති දෙපාර්තමේන්තුවට දැනුම් දීමක් කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

- ✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව තමන් මේ මොහොතේදීම දෙපාර්තමේන්තුවට කතා කර මේ පිළිබඳව විමර්ශන නිලධාරී මහතෙකුගෙන් විමසූ බවත් පළාත් පාලන ආයතන වලට නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරුන් එතැනින් සහභාගී කර නොමැති බව දැනුවත් කල බවත් අවශ්‍ය නම් ඉල්ලීමක් කරන ලෙසටත් පණතේ 215 වගන්තියේ 2 යටතේ නීතිඥවරුන්ට ගෙවීම සම්බන්ධයෙන් පැහැදිලි කර ඇති බවත් සභාවේ කටයුතු වලට නීතිඥවරියක් පත් කරගෙන තිබෙන බවත් එම නීතිඥවරියට යාමට හැකි සීමාවෙන් පිට නැවතත් නිතිඥවරයෙකු පත්කර ගැනීමට සිදුවන බවත් එබැවින් මහා සභාවේ ගාස්තු ගෙවීම සඳහා අනුමැතිය අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලදී.පණතේ 215 වගන්තිය අනුවද එය නිවැරදි බවත් ගාස්තු ගෙවීමට අදාල අවසරයද ලබා දීඇති බැවින් කිසිදු ගැටළුවක් නොවන බවත් මෙහිදී Block fee ගාස්තුව සඳහන් කර ඇත්තේ දෛනික නීතිඥ ගාස්තු වෙනුවට බැවින් එහි සඳහන් ලිඛිත දේශන වලට අදාල ගාස්තුවද Block fee මුදලට අදාල වන බවද ප්‍රකාශ කරන ලදී.

පණත අනුව වැඩ කටයුතු සිදු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහාද කටයුතු කරමුයැයි **ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.**

තමන් සහ ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා සභාවට විය හැකි උපරිම යහපත පිළිබඳව කතා කල බව ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය ප්‍රකාශ කරන ලදී.

පෞද්ගලිකව නීතිඥමහතෙකු ගත් විට එතුමා මේ සඳහා වැඩියෙන් උනන්දු වන බවත්, නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥයින්ට මෙවැනි නඩු අසීමිත ප්‍රමාණයකට පෙනී සිටීමට සිදු වන බවත්, මෙය තම අදහස බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදි. සංචාරක හෝටල්අසීමිතව ලාභ උපයන බවත්, සභාවේ බල පත්‍රයක් නොමැතිව මෙම ව්‍යාපාරය ඔවුන් කරගෙන යන බවත්, මහජනතාවට සභාව මඟින් සේවය ලබා දීමට විශාල බාධාවක් වී ඇති බවත් මන්ද ඔවුන්ගේ බදු මුදල්ද ගෙන මහජනතාවට අප ආයතනය සේවය කරන බවත් ප්‍රකාශ කරන ලදී.වසර ගණනාවක සිට ගෙවීම් සිදු නොකරන බවත් මෙය සමස්ථ හෝටල් පද්ධතියටම බලපාන බැවින් ඔවුන්ද මෙම නඩුව ජය ගැනීමට උත්සාහ කරමුයැයිද ප්‍රකාශ කරන ලදී,

| |
|---|
| තීරණ අංක 04<br>කම්මල, වයික්කාල "ඩොල්ෆින් ක්ලබ් හොටෙල්" ආයතනය විසින් සභාවට එරෙහිව කොළඹ අභියාචනාධිකරණයේ පවරා ඇති CA PHC 202/2019 දරණ නඩුව සඳහා ජනාධිපති නීතිඥ කලිංග ඉන්ද්‍රතිස්ස මහතා පත් කිරීමටත් එම මහතා විසින් ඉදිරිපත් කර ඇති **නීතිඥ ගාස්තු සම්බන්ධවද සාකච්ඡා කිරීමෙන් අනතුරුව එකවිට ගෙවන (Block fee) සම්පූර්ණ ගාස්තුව වන රු.1,050,000.00ක මුදල ගෙවීම සුදුසු බවටත් ගරු සභාපතිතුමා යෝජනා කල අතර ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා එම යෝජනාව ස්ථිර කරන ලදී. ඒ අනුව මෙම යෝජනාව සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී.** |

ii. කිරිමැටියාන මහජන පුස්තකාලය අහස්දූර සිතියම් නිකුත් කිරීමේදී එක් සිතියමක් සඳහා රු.200.00 මුදලක් මේ වනතුරු අයකල බවත් නමුත් වර්තමාන තත්ත්වය තුළ තීන්ත මිල මෙන්ම ලිපි ද්‍රව්‍යය වල

මිල ද ඉහළ යාම හේතුවෙන් එක් සිතියමක් නිකුත් කිරීම සඳහා රු.300.00ක මුදලක් අය කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.

නව පාසල් වාරයේදී සිතියම් නිකුත් කිරීමට සිදු වන බවත්, කඩදාසි 1000 පමණ වාර්ෂිකව අවශ්‍ය වන බවත් රුපියල් 300.00ක මුදලටවත් එය සිදු කිරීමට අපහසු වන බවත්,එබැවින් නැවත මිල ගණන් සංශෝධනයක් තිබුණහොත් මුදල් කමිටුවට යොම කිරීමට සිදු වේයැයිද **ගරු මන්ත්‍රී ඒ.ඒස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.**

තීරණ අංක 05

කිරිමැටියාන මහජන පුස්තකාලය අහස්දූර සිතියම් නිකුත් කිරීමේදී එක් සිතියමක් සඳහා රු.200.00 මුදලක් මේ වනතුරු අයකල බවත් නමුත් වර්තමාන තත්ත්වය තුළ තීන්ත මිල මෙන්ම ලිපි ද්‍රව්‍යය වල මිල ද ඉහළ යාම හේතුවෙන් එක් සිතියමක් නිකුත් කිරීම සඳහා රු.300.00ක මුදලක් අය කිරීම සුදුසු බවට **ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී ඒ.ඒස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා එම යෝජනාව ස්ථිර කරන ලදී. ඒ අනුව මෙම යෝජනාව සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී.**

iii. වසර ගණනාවක සිට සූර්ය බල ශක්තියෙන් විදුලි උත්පාදනය පිළිබඳව අප කතා කල බවත්, අතිගරු ජනාධිපතිතුමා සම්බන්ධීකරණය කර මෑතකදී එය ක්‍රියාත්මක කිරීමට අවසරය ලබා දුන් බවත්, මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශකවරයා ලෙස කටයුතු කරන සුනිත්‍ය බල ශක්ති අධිකාරියේ ඉංජිනේරු සනත් කිත්සිරි මහතා අප බල ප්‍රදේශයේ පුරවැසියෙකු බවත්, එමෙන්ම වෙන්නප්පුව ජෝෂප් වාස් විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෙකු බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.ගරු මන්ත්‍රීවරුන්ට තම පෞද්ගලික මුදලින් නිවෙස් වලද මෙය සවිකරගන්නේ නම් ඒ සඳහාද අවශ්‍ය දැනුම ලබා දීමට එතුමාගෙන් ඉල්ලීමක් කල බවත් මෙම කටයුත්තට කමිටු වලද අනුමැතිය ලැබී කරගෙන යන බවත්,ලබන සතිදෙක පමණ වන විට එම වැඩ කටයුතු සූදානම් කරන බවත් අවශ්‍ය දැනුම මන්ත්‍රීවරුන් සමඟ බෙදා ගැනීමට එතුමාට අවස්ථාව ලබා දෙන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර මේ සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

විෂය භාර නිලධාරී ජේ.ඒ.ඩී.ඒ.පී.එස්.ජයසූරිය මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව ගිය මස සිට මේ මස දක්වා මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව දැනුවත් කරන බව ප්‍රකාශ කරන ලදි. මෙම ව්‍යාපෘතියේ උපදේශකවරයා ලෙස එතුමාව පත් කර ගැනීමෙන් පසුව එතුමා ලවා මෙහි පිරිවිතර සකස් කරගත් බවත්, එයටම ආවේණික වූ පිටු 54කින් යුත් ලංසු ලේඛණයක්ද සකස් කරගත් බවත්, ඒවා ගියවර මුදල් කමිටුවට දමා අනුමත කර ගත් බවත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියට ඉදිරියේදී ණය ලබා ගැනීම සම්බන්ධව දෙපාර්තමේන්තුවට අවශ්‍ය අයදුම්පත් සියළු ලේඛණ සමඟ යොමුකර ඇති බවත්, එය මධ්‍යම රජයේ අමාත්‍යාංශයට යොමුකර එතැනින් අනුමත කර ගැනීමට තිබෙන බවත් ඒ සඳහා අමාත්‍යාංශයේ අධ්‍යක්ෂකතුමා සමඟද සෘජුවම කතාකල බවත් මෙහි කිසිඳු ගැටළුවක් නොමැති බවත්, මුළු මුදලම ලබා දීමට ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කරන බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.වෙළඳපොල පිළිබඳව සොයා බැලූ බවත් මේ දින වල ඩොලර් ප්‍රශ්නය හා පිටරටින් අවශ්‍ය පැනල් ගෙන්වා ගැනීම පිළිබඳවද ගැටළුවක් තිබෙන බවත්,එයටද කඩිනම් අවශ්‍ය ඕඩරය ලබා දුනහොත් හැකි ඉක්මනින් සවි කර ගැනීමට හැකි වන බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව අපට තිබෙන වාසි, විභවතාවය ගැටළු යනාදීය පිළිබඳව සාකච්ඡා කිරීමට සහ ගරු මන්ත්‍රී මණ්ඩලයට තිබෙන ගැටළු වලට පිළිතුරු ලබා ගැනීමට ද සුනිත්‍ය බල ශක්ති අධිකාරියේ විදුලි ඉංජිනේරු සහ ඒ පිළිබඳව නිපුණතාවයක් තිබෙන සනත් කිත්සිරි මහතාට ගෞරවයෙන් ආරාධනා කරන ලදී.

සුනිත්‍ය බල ශක්ති අධිකාරියේ විදුලි ඉංජිනේරු සනත් කිත්සිරි මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව අද දවසේ රටට වඩාත් කාලීන අවශ්‍යතාවයක්ව පවතින පුනර්ජනනීය බල ශක්තිය හරහා ඉදිරියට යාමට ව්‍යාපෘතියක් සූදානම් කර ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීමට තමන්ට ආරාධනා කිරීම පිළිබඳව වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා,ලේකම්තුමා ඇතුළු සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී. තමන් මෙයට අහම්බයෙන් සම්බන්ධ වූ බවත්, මෙම කටයුත්තට සම්බන්ධ වීමට හැකි වීම තම වාසනාවක් බවත් එබැවින් ලබා දීමට හැකි උපරිම සහයෝගය ලබා දෙන බවද ප්‍රකාශ කරන ලදී. ලංකාවේ වසරකට පමණ පෙර විදුලි විසන්ධි වීමකදී සූර්ය බල ශක්ති පද්ධතිය හරහා විදුලි අවශ්‍යතාවය ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් තිබූ බවත්,මේ වන විට එම හැකියාව තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මෙම ආයතනය සලකා බැලීමේදී තමන් පළමුව ස්ථාන පරීක්ෂා කල බවත්, එහිදී ස්ථාන තුනක් මේ සඳහා තෝරා ගත් බවත් ඒ සමබන්ධ තොරතුරුද සභාවට ඉදිරිපත් කරන ලදී. පෞද්ගලිකව මෙවැනි සූර්ය බල ශක්ති පද්ධතියක් සවි කර ගැනීමට සූදානම් වන්නේ නම් එතැනදී ප්‍රධානව සලකා බැලිය යුත්තේ නිවසට විදුලිය ලබා ගැනීමේදී විදුලි බල මණ්ඩලය සමඟ ගත වී තිබෙන ගිවිසුම පිළිබඳව බවත්, ලබාගෙන තිබෙන ධාරිතාවය අනුව මෙය සවිකරගත හැකි බවත් නමුත් තිබෙන නෛතික ගැටළුව වන්නේ එහිදී වහලයේ තිබෙන ඉඩ ප්‍රමාණය අනුව එය සවිකරගත නොහැකි වීම බවත්, එය වෙනස් කර ගැනීමටද හැකියාව තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම එහිදී විදුලි බල මණ්ඩලයෙන් අනුමැතියක් ගතයුතු බවත්,සියළු දත්ත බලා ලබා ගත හැකි ප්‍රමාණය විදුලි බල මණ්ඩලයෙන් තීරණය කරන බවත් ප්‍රකාශ කරන ලදී. තමන්ද තම නිවසේ මෙය සවිකර ගෙන ඇති බවත්, මෙම පද්ධතිය එකල ලක්ෂ 07 සිට ඉහළට තිබූ බවත් නමුත් අද වන විට ලක්ෂ 19 සිට ලක්ෂ 22 අතර වන මිල වැඩි වීමකට පත් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. අද වන විට රටේ තිබෙන විදුලි අර්බුදය පිළිබඳවද පැහැදිලි කිරීමක් මෙහිදී සිදු කරන ලදී. නිවසක වැය වන විදුලි ඒකක ප්‍රමාණය අනුව මෙම පද්ධතිය තෝරා ගන්නා ආකාරයද, එම පද්ධතිය මඟින් නිවසේ එදිනෙදා වැඩකටයුතු සිදු කර ගන්නා ආකාරය පිළිබඳවද තම නිවසේ පද්ධතිය මඟින් උදාහරණ දක්වමින් පැහැදිලි කිරීමක් සිදු කරන ලදී. මෙවැනි පද්ධතියක් තුළින් තිබෙන වාසිද එහිදී ඉදිරිපත් කරන ලදී.අවශ්‍ය දැනුම ලබාදීමට තමන් සූදානම් බවත්, නිවසක සූර්ය බල ශක්ති පද්ධතියක් සවිකර ගැනීමට අවශ්‍ය නම් පසුගිය මාස 12ක විදුලි බිල්පත් ගෙන බලා අවශ්‍ය පද්ධතිය තීරණය කල යුතු බවත්, අවශ්‍යතාවය තිබේනම් තමාව සම්බන්ධ කර ගන්නා ලෙසත් සහයෝගය තමන් ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී. සභාවට වසර 07ක් පුරාවට රු.22 බැගින් ඒකකයට මුදලක් ලබාදෙන බවත්, 07 වන වසරේ සිට 20 වන වසර දක්වා රු.15.50ක් ලබාදෙන බවත්, ණය ලබාගෙන ණය ගෙවා ගැනීමට යන කාලය බලා පළමුව වැඩි මුදලක්ද ඉන්පසුව මුදල අඩුවනුයේ මෙය ව්‍යාපාරයක් ලෙස නොව බල ශක්ති සුරක්ෂිතතාවය යන වැඩපිළිවෙල නිසා බැවින්යැයිද පැහැදිලි කරන ලදී.මෙහි ක්‍රමවේද තුනක් තිබෙන බවත් ඒ පිළිබඳව සභාව දැනුවත් කරන ලදී. මෙම පද්ධතිය රශ්නයට නොව ආලෝකයට වැඩ කරන බවත්, පැනල් රත් වූ විට කාර්යක්ෂමතාවය අඩු වන බවත් පැහැදිලි කරන ලදී. මෙම සභාවට net accounting ක්‍රමවේදය වාසි වන බවත්, ඒ පිලිබඳව පැහැදිලි කරමින් ප්‍රකාශ කරන ලදී. සූර්ය පැනල් පද්ධතියක් මිල දී ගැනීමේදී සලකා බැලිය යුතු කාරණාද සඳහන් කරන ලදී.

මෙහිදී ගරු මන්ත්‍රීවරුන්ද තම අදහස් සහ ගැටළු ඉදිරිපත් කරන ලදී.

එමෙන්ම වෙන්නප්පුව සහ දංකොටුව ප්‍රධාන නගර වල ඉදි කර තිබෙන විදුලි කණු වල බල්බ එක් විට උදෑසනට නිවීමේ සහ රාත්‍රියට පත්තු වීමේ ක්‍රමවේදයක් සකස් කර දෙන ලෙසට මෙතුමාගෙන් ඉල්ලීමක් කල බවත් එය සාදා දෙන බවට එතුමා පැවසූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මෙම කටයුතු වලට සහභාගී වීමට එතුමාද කැමැත්තෙන් සිටි බවත්, මෙම බල ප්‍රදේශයේම පුරවැසියෙකු බවත් ප්‍රකාශ කරන ලදී. ලබන මාසය වන විටම මෙම කටයුතු ආරම්භ කරමුයැයිද පවසා සිටින ලදී, මෙම අවස්ථාවට සහභාගී වී ගරු මන්ත්‍රී මණ්ඩලය දැනුවත් කිරීම පිළිබඳව ගරු සභාපතිතුමා විසින් සුනිත්‍ය බල ශක්ති අධිකාරියේ විදුලි ඉංජිනේරු සනත් කිත්සිරි මහතාට ස්තූතිය පුද කරන ලදී.

මුළු ලංකාවටම මෙගා වොට් කීයක් අවශ්‍යදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

එය වෙනස් වන බව සනත් කිත්සිරි මහතා පැහැදිලි කරන ලදී.

සූර්ය බල ශක්තියෙන් සහ සුළං මඟින් දහවල් කාලයේ විදුලිය භාවිතය ආවරණය කිරීමට හැකිදැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

අප රට දුප්පත් රටක් බැවින් ඒ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වන බව සනත් කිත්සිරි මහතා පැහැදිලි කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා, ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා, ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා තම අදහස් සහ ගැටළු මෙහිදී ඉදිරිපත් කරන ලදී.

වැඩිදුර තොරතුරු හා උපදෙස් ලබා ගැනීම සඳහා සනත් කිත්සිරි මහතා තම ජංගම දුරකථන අංකය ලබා දෙමින් තම වැඩ සටහන අවසන් කරන ලදී.

iv. දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය ඉදිරිපිට පිහිටා ඇති කඩා වැටීමට ආසන්න පැරණි පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

මෙය ප්‍රාදේශීය ලේකම්තුමියගේ ඉල්ලීමක් බවත්, 2022-06-17වන දින මේ පිළිබඳව සාකච්ඡා කල බවත්,අවශ්‍ය නීතිමය තත්ත්වය පිළිබඳ සාකච්ඡා කිරීමට ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතාව සම්බන්ධ කරගත් බවත්, මෙය ප්ලෑන් එකේ drawing එකකින් ගනිමුයැයිද සාකච්ඡා කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙහි තිබෙන පර්චස් 40ක ඉඩම පළමුව ගම් සභාවට, සුළු නගර සභාවට තිබූ පසුව ප්‍රාදේශීය සභාවද එතැන සිටියදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එම ස්ථානයේ ස්ථාපිත වූ බවත්, අද වන විට මෙහි අයිතිකරු ලෙස ප්‍රාදේශීය ලේකම් පෙනී සිටින බවත් ප්‍රකාශ කරන ලදී. ප්‍රාදේශීය ලේකම්තුමිය පුස්තකාල ගොඩනැගිල්ල කඩා ඉඩ ලබාදෙන ලෙසට ඉල්ලීමක් කරන බවත්,එමෙන්ම පසුගිය දින තිබූ රැස්වීමේදී යම් ප්‍රමාණයක් එනම් සභා කාර්යාලය,පෙර පාසල් ගොඩනැගිල්ලි යනාදිය අපට ලැබීමටත් පුස්තකාලය තිබෙන කොටස ඔවුන්ට ලැබීමටත් ලෙස සාකච්ඡා වූ බවත් ප්‍රකාශ කරන ලදී. එහිදි පිඹුරු පතේ එම කොටස සඳහන් කරමින් සාකච්ඡා කල බවත් එම කොටස ලියමනත් සමඟ ඇමුණුමක් ලෙස තිබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.අද තිබෙන තත්ත්වය අනුව යම් ස්ථාන සභාවට අහිමි වන තත්ත්වයට පත් වී ඇති බවත් ඒබැවින් අප සීමා නිර්ණ නිවැරදිව ලකුණු කර මෙය සිදු කරගතහොත් හොඳයැයිද, කලකට පෙර රජය විසින් ප්‍රාදේශීය සභා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සියල්ලම එක පරිශ්‍රයක ස්ථාපිත කල බවත්, මේ වන විට ඒවාට සීමා නිර්ණයන් ලකුණු කර ගැනීමේ අවශ්‍යතාවයක් තිබෙන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

කඩා ඉවත් කිරීමට පෙර මෙම පරිශ්‍රය මායිම් දමා අවසන් කරගන්නා ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඊළඟ මුදල් කමිටුවේදී හෝ මේ සම්බන්ධව සාකච්ඡා කරමුයැයි ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය ලේකම්තුමිය සභාවට කැඳවා සාකච්ඡාව සූදානම් කලද ඉන්පෙර එතුමිය ගරු සභාපතිතුමාව කැඳවූ බවත් තමන්ද එයට සහභාගී වූ බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.දැනට පිහිටි භූමිය තුළ දංකොටුව-පන්නල ප්‍රධාන මාර්ගයේ ඉදිරිපස තිබෙන රණවිරු ස්මාරකය අද්දරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඇතුළු වන ගේට්ටුවක් සවි කර ගැනීමට ප්‍රාදේශීය ලේකම්තුමිය එකඟතාවය ඉල්ලා සිටි බව ප්‍රකාශ කරන ලදි. මෙහිදී ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා පවසන දෙයට සම්පූර්ණයෙන් එකඟවීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.

වාහන නැවතුම්පොල පිළිබඳව ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

තිස්ස මංචනායක මහතාගේ නිවස අසලින් තිබෙන ගේට්ටුවෙන් ඇතුළු වුවහොත් පුස්තකාල ගොඩනැගිල්ල ඉවත් කරගත් පසුව ඔවුන්ට වාහන නැවැත්වීමට ඉඩ තිබෙන බවත්, සියල්ලම නැවැත්වීමට ඉඩ ප්‍රමාණවත් නොවුනහොත් ප්‍රධාන මාර්ගයෙද ඉඩකඩ ගැනීමට හැකිනම් එය ලබා ගැනීමට සිදු වන බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.එහිදී අප

ගේට්ටුවේ බුදු පිළිමය අසලින් ප්‍රවිශ්ය වීමෙන් ඔවුන්ට ඉවත් වීමට සිදු වන බවත් ප්‍රකාශ කරන ලදී.එම ඉඩමේ මැද බිම් කොටස අපට සන්තක වීමට තිබිය යුතු බවත් පෙර පාසලට ඇතුළත් වන ප්‍රවිශ්යයේ එතුමියගේ නිල නිවස තිබෙන බවත් එබැවින් එතුමිය  එම පාර පොදු පාරක් කරන ලෙසට ඉල්ලීමක් කරන බවත් ප්‍රකාශ කරන ලදී. තමන් එම අවස්ථාවේදී එසේ නම් පිටුපස තිබෙන සභාව සතු පාරෙන් ඇතුල් වන ලෙසට යෝජනාවක් කල බවත් එය එම අවස්ථාවේදී එතුමිය අපහසුතාවයක් ලෙස සැලකූ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එතුමිය කාර්යාලයේ සිටියදී නිල නිවසට යාමට සිදු වුවහොත් එලෙස ඉල්ලීමක් කල බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පුස්තකාල ගොඩනැඟිල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අවසර ගෙන සෑදූ ගොඩනැඟිල්ලක් නොව අප අයිතියට සෑදූ ගොඩනැඟිල්ලක් බව ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ගරු මන්ත්‍රීවරුන්ද තම අදහස් ඉදිරිපත කරන ලදී.

එලෙසම නගර ශාලවේ ඉඩම් කැබැල්ලක් ඉල්ලාද මින් පෙර කර්මාන්ත කමිටුවට යොමු කර තිබූ බවත්,එයට විරුද්ධ වූ බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදි.

මෙම භූමිය නොදෙන්නේ නම් නගර ශාලා භූමිය නොදෙන බව වාචිකව පවසා තිබූ බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

**survey plan එකක් ගෙන ඊළඟ මහා සභාවට හෝ මුදල් කමිටුවට යොමු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

මෙය මැනීමට ගියහොත් දිසාපති අසලට යාමට සිදු වන බවත්, කාර්යාල 2ක එකතු වී අදාල නීතිමය කටයුතු සමඟ මැනුම් කරමුයැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

අප විසින් ප්ලෑන් එක ඇඳ ගනිමුයැයි ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 06

**මේ පිළිබඳව දීර්ඝව සාකච්ඡා කල ගරු මහා සභාව පළමුව උප කාර්යාලයට අයත් වන බිම් කොටස සඳහා survey plan එකක් ගනිමුයැයිද , ඉන්පසුව මෙය මුදල් කමිටුවට යොමු කිරීමෙන් පසු අදාල පුස්තකාල ගොඩනැඟිල්ල කඩා ඉවත් කර දීම සුදුසු බවට සාකච්ඡා කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඒස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව මෙම යෝජනාව සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී.**

iv. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ඕතර උතුර උප කාර්යාලයේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන තාක්ෂණ නිලධාරී ටී.ඩබ්.ආර්.කමල් මහතාගේ සේවා කාලය 2022.08.14 වන දිනෙන් අවසන් වන බැවින් එම සේවා කාලය නැවත 2022.08.15 වන දින සිට මාස දහයක කාලයක් සඳහා දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දීමට අදාල යෝජනාව  ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

සේවා කාලය දීර්ඝ නොකරන ලෙසට දෙපාර්තමේන්තුව මඟින් ලිපියක් එවා තිබෙන බවත්,ඒ සඳහා නීතිය පසින් කමක් කරන්නේදැයිද,  ගරු සභාපතිතුමා විමසා සිටින ලදී. තාක්ෂණ නිලධාරී ටී.ඩබ්.ආර්.කමල් මහතා වැනි අත්දැකීම් සහිත නිලධාරීන්ගේ සේවය අවශ්‍ය බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

✪ ගරු සභාපතිතුමාගේ හා ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහා සභා අවස්ථාව කාරක සභා අවස්ථාවක් බවට පත් කර ලේකම්මහතාට තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී.

ලේකම් මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව කොන්ත්‍රාත් පදනමින් සේවකයින් බඳවා ගැනීම පිළිබඳ වර්තමාන තත්ත්වය දැන ගැනීමට අවශ්‍ය බැවින් රාජ්‍ය සේවා කොමිසමෙන් එවූ ලිපිය සභාවට යොමු කල බවත්, කොන්ත්‍රාත් පදනම මත සේවා කාලය දීර්ඝ නොකරන ලෙසට දැනුම් දී තිබුණද අප සභාවේ උපකාර්යාල තුනකින් සහ ප්‍රධාන කාර්යාලයක් මඟින් පාලනය වන වෙන්නප්පුව බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු පවත්වාගෙන යාමේදී තාක්ෂණ නිලධාරීන් සඳහා විශාල වැඩ කොටසක් පැවරෙන බවද,මේ වන විට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට අනුයුක්ත කර ඇත්තේ තාක්ෂණ නිලධාරීන් තිදෙනෙකු පමණක් බවද,පලාත් පාලන දෙපාර්තමේන්තුවේ නියෝග මත අනුප්‍රාප්තිකයෙකු රහිතව පසිඳු සුභසිංහ තාක්ෂණ නිලධාරී මහතාව නිදහස් කර යැවීමට සිදු වූ බවද ප්‍රකාශ කරන ලදී. ප්‍රාදේශීය සභාවක් ලෙස සභාවේ කටයුතු පවත්වාගෙන යාමට තාක්ෂණ නිළධාරීන්ගේ සේවය අත්‍යවශ්‍යය බැවින් මෙම නිලධාරී මහතා නැවත සේවයට ගන්නේදැයි තීරණය කල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

මෙම කරුණු පැහැදිලි කර ලිඛිතව ඉදිරිපත් කරන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

අනුප්‍රාප්තිකයෙකු රහිතව තාක්ෂණ නිලධාරී පසිඳු සුභසිංහ මහතාව නිදහස් කර යැවූවේ මන්දැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

කොමසාරිස්තුමා විසින් එම ස්ථාන මාරුව එවූ බව ලේකම්මහතා ප්‍රකාශ කරන ලදී.

එවිට අනුප්‍රාප්තිකයෙකු රහිතව ස්ථාන මාරුව ලබාදුන්නේ මන්දැයි විමසීමක් සිදු නොකරේදැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සේවකයෙකු සම්බන්ධයෙන් කොමසාරිස්තුමාට ඕනෑම තීන්දුවක් ගත හැකි බව ලේකම්මහතා පැහැදිලි කරන ලදී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් ගත් තීරණ කිසි දිනක ආපස්සට නොගන්නා බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මහා සභාවේ අනුමැතියට යටත්ව, වර්තමාන තත්ත්වයද පැහැදිලි කර ලිපියක් ඉදිරිපත් කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ලිපියේ මාස 10 ලෙස සඳහන් කර තිබෙන බවත්,නමුත් එය දෙසැම්බර් 31 දක්වා ලෙස සඳහන් කර තීරණය ගනිමුයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මාස 10න් පසුව එම මහතාට වයස අවුරුදු 67 සම්පූර්ණ වන බවත්, ඉන් පසුව නැවත සේවයට ගත නොහැකි බවත් ලේකම් මහතා ප්‍රකාශ කරන ලදී.

මාස 10 යනු වසරකට මාස 2ක් අඩුවෙන් බවත්, අඩුම ගානේ මේ වසරේ දෙසැම්බර් 31 දක්වා ලෙස යැයි තීරණය ගත්විට යම් විට අවසරය ලැබෙයැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් දෙසැම්බර් මස වන තෙක් අවසර ඉල්ලමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී සේවා අවශ්‍යතාවය පැහැදිලිව සඳහන් කර ඉල්ලීම ඉදිරිපත් කරන ලෙස ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා අදහස් දක්වන ලදී.

තාක්ෂණ නිලධාරී අවශ්‍යතාවය තදින්ම තිබෙන බව සඳහන් කරන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 07

**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව උප කාර්යාල තුනකින් සහ ප්‍රධාන කාර්යාලය මඟින් බල ප්‍රදේශයේ සියළු කටයුතු පවත්වාගෙන යන අතර වාර්ෂික අයවැය ලේඛණය මඟින් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 250ක් පමණ වාර්ෂිකව වෙන් කරනු ලබන බවද, ඊට අමතරව පලාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශ ප්‍රතිපාදනස මඟින් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරනු ලබන බවද සාකච්ඡා කල අතර මෙම කාර්යාලය වෙත අනුයුක්ත කර සිටි තාක්ෂණ නිලධාරී තිදෙනාගෙන් එක්**

| |
|---|
| **අයකු අනුප්‍රාප්තිකයෙකු රහිතව ස්ථාන මාරු කර යවා ඇති බවද, දරනට සිටින තාක්ෂණ නිලධාරීන් දෙදෙනාට කිසිසේත්ම වෙන්නප්පුව බල ප්‍රදේශයේ සියළු සංවර්ධන කටයුතු සඳහා දායකත්වය ලබා දිය නොහැකි වන බවද එබැවින් මෙම බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක කිරීම ඇනහිටින බවද පෙන්වා දෙමින් දැනට කොන්ත්‍රාත් පදනමින් සේවයේ යොදවා ඇති.ඩබ්.ආර්.කමල්** මහතාගේසේවය තවදුරටත් ලබා ගැනීම අත්‍යවශ්‍ය බැවින් ඔහුගේ සේවා කාලය 2023 පෙබරවාරි මස 15 දක්වා මාස 06ක් දීර්ඝ කිරීම සුදුසු බවද තීරණය කරන ලදී. **මෙම යෝජනාව ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී ඒ.ඒස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා එම යෝජනාව ස්ථිර කරන ලදී. ඒ අනුව මෙම යෝජනාව සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී.** |

**b.**ගරු මන්ත්‍රී යෝජනා

**i.** 2022 වර්ෂයේ අංක 24 කම්මල කොට්ඨාසය සඳහා වෙන් කර තිබෙන ප්‍රතිපාදන මුදලින් යෝජනා කර තිබෙන සංවර්ධන යෝජනා වෙනුවට කොට්ඨාසයේ සිටින ආර්ථික අර්බුදයට මුහුණ පා සිටින පවුල් (රජයේ සේවකයින්ද ඇතුළුව) සඳහා හාල් කිලෝ 2 ½ බැගින් ලබා දීම සුදුසු බවටත් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු මන්ත්‍රී ඩබ්. ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව එම මහතා විසින් ඉවත් කර ගන්නා ලදී.

## <u>04. කාරක සභා වාර්තා සලකා බැලීම</u>.

i. 2022.06.13/2022.07.05 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සලකා බැලීම

| |
|---|
| තීරණ අංක 08<br><br>2022.06.13/2022.07.05 වන දින වල පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ සහ ගරු මන්ත්‍රිනි අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

ii. 2022.05.27 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව සලකා බැලීම

අද දින තාක්ෂණ නිලධාරීන්ට රැස්වීමක් තිබෙන බවත්, 2022 අයවැය යෝජනා නව රේට්ස් සමඟ ඇස්තමේන්තුගත කිරීමට සූදානම් බවත්, එබැවින් ලබන අඟහරුවාදා දින කර්මාන්ත කමිටුව රැස්වන ලෙසත්,එයට යෝජනා ඉදිරිපත් කරන බවත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව කර්මාන්ත කමිටුවට සම්බන්ධ කාරණාවක් ඉදිරිපත් කිරීමට තිබෙන බවත්, අනවසරයෙන් මාර්ගයට ජලය බැස්සවීම සම්බන්ධ ලිපියක් තිබෙන බවත් එය සභාගත කරන බවත් ප්‍රකාශ කරන ලදී. ජයවීදි මාවතේ ජයශාන්ත පෙරේරා මහතාගේ පෞද්ගලික මාර්ගයට ජලය එවීමක් පිළිබඳව එම ලිපියේ සඳහන් වන බවත්, මෙය ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාගේ කොට්ඨාසයේ ගැටළුවක් බවත් එතුමා අද දින මහා සභාවට සහභාගි නොවී ඇති බවත් නමුත් එතුමාද ගරු සභාපතිතුමාද මේ පිළිබඳව දැනුවත් බවත් ප්‍රකාශ කරන ලදී. මේ සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසත් එමෙන්ම අවසර නොමැතිව එම මාර්ගයට කොන්ක්‍රීට් දමා ඇති බවත් එය වැරදි බවත්, කුමන පදනමින් එය සිදු කරේදැයි නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාට අසනීප බවත්, මෙම ලිපිය සභාගත කරන ලෙසත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

මේ සඳහා ගරු සභාපතිතුමා ක්‍රියාමාර්ග ගෙන ඇති බවත්, නමුත් නැවත එය සිදු වන බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 09<br><br>2022.05.27 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ සහ ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

iii. 2022.06.17 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව සලකා බැලීම

විදුලි අළුත්වැඩියා සඳහා මාසයට එක් වරක් කොට්ඨාසයට එවන බවත් මේ වන විට අළුත්වැඩියා කටයුතු අඩු වී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. මේ දින වල තෙල් ප්‍රශ්නයද තිබෙන බවත්, ප්‍රමාණය විශාල කොට්ඨාස වල බල්බ 30-35ක් පමණ සවි කරන බවත්, මෙහිදී ගරු මන්ත්‍රීවරුන්ද වගකීමෙන් වැඩ කරන ලෙසත් සෑදීමට තිබෙන බල්බ වාහනය පැමිණීමට පෙර සඳහන් කර තබා ගන්නා ලෙසත් දැනුම් දෙන ලදී.

| |
|---|
| තීරණ අංක 10<br><br>2022.05.27 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතාගේ සහ ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

iv. 2022.06.30 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

අද දින මෙම කමිටු වාර්තාව ලැබුණ බවත්, මෙම වාර්තාවේ තමන්ද මින් පෙරදී මහා සභාවේ සඳහන් කල රංග ටෙලර්ස් සම්බන්ධ ගැටළුව පිළිබඳව සඳහන් වන බවත්,මෙම කමිටුව 06/30 වන දින පැවැත්වූ බැවින් මේ වන විට ඒ සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා විමසා සිටින ලදී.

රංග ටෙලර්ස් හි එම මහතා වැඩ අධිකාරී මහතාගේ අධීක්ෂණය යටතේ වැඩ කටයුතු සිදු කරන බවත්, ලබන සතියේ දින අවසන් වන බවත්, ඉන්පසුව උසාවි යන්නේද නැද්ද යන්න තිරණය කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 11<br><br>2022.05.27 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රමාලතා මහත්මියගේ සහ ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

## 05.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.

**i. 2022 මැයි මස 31 වන දිනට ආදායම් හා වියදම් සාරාංශය සලකා බැලීම**

| |
|---|
| තීරණ අංක 12<br><br>**2022 මැයි මස මාසික ඒකාබද්ධ ආදායම් /වියදම් සාරාංශය** පිළිබඳ වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය |

**iii. 2022 ජුනි මස ඉන්ධන හා අළුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව සලකා බලන ලදී.**

**iv. 2022 වර්ෂයේ ජුනි මස වීථි පහන් නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව සලකා බලන ලදී.**

## 06. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.

(i). තමන් පරිසර කමිටුවට සහභාගී වූ බවත්,නමුත් සහභාගි නොවූ ලෙස සඳහන් කර ඇති බවත් ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

එය සංශෝධනය කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

(ii).ADP ව්‍යාපෘතියේ ණය පිළිබඳව විමසූ බවත්, දෙකෝටි දස ලක්ෂ තිස්හයදහස් විසි හතරක් ලබාගෙන දංකොටුව සීජේ මාවත සහ මිරිසන්කොටුව පාර සංවර්ධනය කිරීම සිදු කර ඉතිරි මුදලින් මෝටර් ග්‍රේඩරයක් මිලදී ගෙන ඇති බවත් එය 2011-12-31 සිට 2022-12-31 අවසන් බවත්, සූර්ය පැනලයට නැවත ණයක් ගැනීමට සිදු වන බවත්, එමෙන්ම නගර ශාලාවේ වැඩ කටයුතු ද අවසන් කිරීමට තීරණය කරමුයැයි ගර සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

දංකොටුව ජල පරිපහදු ඒකකයේ ගැටළුවක් තිබෙන බවත්, ලක්ෂ 60ක් පමණ වැය වීමට තිබූ එම වැඩ කටයුත්තට මේ වන විට කෝටියක් පමණ වැය වන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

වෙන්කල ලක්ෂ 70 මුදලට යම් වැඩ කටයුත්තක් සිදු කරමුයැයිද මෙය හොඳ ව්‍යාපෘතියක් බවත් නමුත් කුරුණෑගලින් අවශ්‍ය නීතිරීති ගලපාගෙන ඒමේදී කාලය ගත වූ බවත්,පලාත් පාලන ඉංජිනේරුවරුන්ගේ මෙම වැඩ කටයුතු සිදු කිරීම සම්බන්ධව අප්‍රසාදය එල කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

(iii). ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව හිටපු ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට අවාසනාවන්ත ලෙස පිට වීමට සිදු වීම පිළිබඳව විපක්ෂයක් ලෙස ශෝකය ප්‍රකාශ කරන ලදී. අරගලකරුවන්,පොදු ජනතාව මුහුණ දී තිබූ විශාල පීඩාව නිසා තරුණ කණ්ඩායම පහසුවෙන් පාරට ගෙන්විය හැකි කණ්ඩායමක් නොවූවත් ඔවුන්ව පහසුවෙන් ගෙන්විය හැකි වූ බවත් ප්‍රකාශ කරන ලදී. මන්ත්‍රීවරුන්ද පෝලිං වල සිටි බවත් යම් ලෙසකින් මන්ත්‍රීවරුන් එම කර්තව්‍ය ඉටු කරගත්තද තරුණ කණ්ඩායම් විශාල පීඩනයකින් සිටි බවත්, දරුවන් පාසල් යාමේ පීඩනයකින්ද සිටි බවත් එම පීඩනය පුපුරා යාමෙන් ඇති වූ ප්‍රතිපලයක් ලෙස ජනාධිපතිතුමාට අවාසනාවන්ත ලෙස පිටවීමට සිදු වූ බවත් ප්‍රකාශ කරන ලදී.තමන් දේශපාලනයේ යම් කලක් රැඳී සිටි පුද්ගලයෙකු ලෙස අනෙක් සියළු දෙනාගේ වැරදි ජනාධිපතිතුමා මතින් ගියායැයි සිතනා බවත්, මෙතුමා වසර 02ක වැනි කෙටි කාලයක් ජනාධිපති ලෙස සිටි බවත් ප්‍රකාශ කරන ලදී.කොවිඩ් සමයේදී කාලය ගෙවී ගිය බවත්,එතුමාට පෙර සිටි සහෝදර ඥාතී පිරිස කල වැරදි පාලන ක්‍රමයේ සහ ජනතාව තුළ දෝශ දර්ශනයට ලක් වීමේ ප්‍රතිපලයක් ලෙස ජනාධිපතිතුමාට

මෙසේ සිදු වූ බවත්, එතුමා පුටුවේ හිඳගත්තද එතුමාට රජකාරී කිරීමට කෙතරම් දුරට හැකියාව ලැබුණේදැයි ප්‍රශ්නය රට වැසියන් සියළු දෙනාටම තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.ගරු සභාපතිතුමා ඉතාමත් පහසුවෙන් බල ප්‍රදේශය පාලනය කරගෙන යන බවත්, නමුත් ජනාධිපතිතුමාට පහසුවක් මෙන්ම ස්වාධිනත්වයක් නොලැබුණේයැයි අප මතය බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. තුනෙන් දෙකක ජන බලයක් තිබුණද බොහෝ විට අග්‍රාමාත්‍යතුමාත්,බැසිල් රාජපක්ෂ මැතිතුමාලත් එම බලය එතුමන්ලාට අවශ්‍ය විධියට පාලනය කල බවත් ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන් රට අද වන විට අවාසනාවන්ත තත්ත්වයට පත් වී ඇති බවත්,නමුත් රාජපක්ෂ මැතිතුමන්ලාගේ නාමය යුද්ධයේදී නායකත්වය ලබා දීම සහ දේශපාලනයේදී නායකත්වය ලබා දීම යන අවස්ථාවලදීද, සරත් ෆොන්සේකා මැතිතුමාට යුධ ජයග්‍රහණ නායකත්වයද ආරක්ෂක අංශ රහස් සේනාංක සංවිධානය කිරීමේ ගෞරවය ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාටත් ලෙස එම ගෞරවය තුනට බෙදී හොඳ නමක් තබාගෙන සිටි බවත්, නමුත් අද වන විට එම නම ඉතාමත් අඳුරු ස්ථානයකට පත් වී ඇති බවත් කාලයත් සමඟ ඇති වූ ව්‍යාසන තත්ත්වයත් සමඟ ඉතිහාසයේ රටවල් කීපයක් දැක ඇති බවත් එම රටවල නායකයින්ගේ ලැයිස්තුවට රජපක්ෂ නාමයත් ඇතුළත් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.කිසිවෙකුත් මෙතැන සිටින මන්ත්‍රීවරයෙකුවත් ග්‍රාමීය නායකයෙකුවත් විශේෂයෙන්ම උනන්දු වී වැඩ කටයුතු කල සංඝයාවහන්සේලාවත් මෙවැනි තත්ත්වයක් බලාපොරොත්තු නොවූ බවත්, වියත් මඟ හරහා තරුණ තරුණියන් විශාල ඉච්ඡාභංගත්වයට පත් වූ බවත්, ඔවුන් බලාපොරොත්තු වූ අපට ඉන්න හිතෙන රටක් යන්න නැති වී ගිය බවත්, තරුණ තරුණියන්ව මෙවැනි තත්ත්වයට පත් වුයේ එතුමාගේ කටයුතු නිසා බවත්,ඕනෑම කෙනෙකුට බලාපොරාත්තු දී එම බලාපොරොත්තු විනාශ වී ගිය පසුව යම් යම් පළිගැනීමේ චේතනාවන් එන බවත් ප්‍රකාශ කරන ලදී. ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන්ද එමෙන්ම එම ඡන්දය ලබානොදුන් අපද ඡන්දය පැරදුන පසුව සිතුයේ ගෝඨාභය රාජපක්ෂ මහතා දක්ෂයෙකු බවත් ආරක්ෂක ලේකම් කාලයේදී යුද්ධය පැවතියදී එතුමා එක් බෝම්බයක්වත් මෙම ප්‍රදේශ වල පුපුරන්නට නොදී එතුමා දක්ෂව වැඩ කටයුතු කල බවත් ඇත්තෙන්ම කණගාටු බවත් ප්‍රකාශ කරන ලදී.එවැනි දක්ෂ පවුලක් අද වන විට රතු ලැයිස්තුවට නම් වැටීම පිළිබඳව කණගාටුවද ප්‍රකාශ කරන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.